f Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය :- 29

විෂය :- නාට්‍ය හා රංගකලාව

ශ්‍රේණිය :- 11

සකස් කිරීම :- කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**නිපුණතා මට්ටම - 2.5**

## නාට්‍ය පෙළ රචනය

01. නාට්‍ය පෙළ හඳුන්වන වෙනත් නමක් වන්නේ ?

02. නාට්‍ය පෙළක් යනු කුමක් ද ?

03. නාටෝචිත අවස්ථාවක් යනු කුමක් ද ? කෙටියෙන් හඳුන්වන්න.

04. නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධානියා වන්නේ කවරෙක් ද ?

05. නිවැරැදි පිළිතුර තෝරන්න.

**නාට්‍ය පිටපතක අන්තර්ගත නොවන්නේ,**

**i. ගැටුම් අවස්ථා ii. රංග විධාන iii. චරිත නිරූපණ iv. සංවාද**

06. නිවැරැදි පිළිතුර තෝරන්න.

**නිෂ්පාදන පිටපත සකස් කරනු ලබන්නේ,**

**i. පෙළ රචකයා විසිනි i. අධ්‍යක්ෂවරයා විසිනි**

**iii. අර්ථපති විසිනි iv. වේදිකා පාලක විසිනි**

07. නොගැළපෙන පිළිතුර තෝරන්න.

**නාට්‍ය රචකයා පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනී,**

**i. චරිත නිරූපණය ii. සංගීතය iii. කතා වින්‍යාසය iv. නාට්‍ය රස**

08. නාට්‍ය පෙළක් රචනා කිරීමේ ක්‍රියා පිළිවෙළ සාරාංශ කර දක්වන්න.

09. නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

10. පහත සඳහන් කතා සැකිල්ල උපයෝගී කරගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

කුඩා කල සිට ම මව නොමැතිව තම පුතා හදා වඩා ගත් සියාතු උසස් අධ්‍යාපනයෙන් පසුව එංගලන්තයට ගිය තම පුතු එනතුරු හැම දිනක ම දෑස් දල්වා බලා හිඳීම පුරුද්දක් කරගෙන සිටී. දහවල කෙටි නින්දකට වැටී සිටි ඔහුට තම පුතු විත් දොරට තට්ටු කරන හඬ ඇසී දොර හැර බැලූ විට.....



* සංවාද, රංග විධාන සහිතව පෙළ නිර්මාණය කරන්න.
* චරිත අතර ගැටුමක් ඇති වන ආකාරයෙන් පෙළ නිර්මාණය කරන්න.
* දෙගිඩියාව, උත්ප්‍රාසය හා කුතුහලය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරන්න.